# ගංවතුරෙන් වක්වැල්ල පාලමේ හිරවුණු සුන්බුන් නාවික හමුදාවෙන් ඉවත් කරයි



(ඉන්දිකා රාමනායක)

ගංවතුරට ගසාගෙන ගාල්ල වක්වැල්ල පාලමේ සිරවී තිබූ අපද්‍රව්‍ය පෙරේදා (27) ඉවත් කළ බව නාවික හමුදාව කියයි.

ගංවතුරේ ගසාගෙන ආ විශාල දැව කොටන් සහ අපද්‍රව්‍ය වක්වැල්ල පාලමේ යට කොටසේ හිරවීම නිසා ජලය බැස යෑමට නොහැකිව ගිං ගඟේ ජලමට්ටම ඉහළ ගොස් තිබුණි.

මෙම තත්ත්වය සැලවීමත් සමග නාවික හමුදාව විශේෂ යාත්‍රා බළඝනයේ සහ මෙරීන් බළඝනයේ භටයන් 75 කට ආසන්න කණ්ඩායමක් මෙම දැව කොටන් හා අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා යොදවා තිබූ බව නාවික හමුදාව පවසයි.

මෙම දැව කොටන් ඉවත් නොකළේ නම් ගිං ගඟේ ජල මට්ටම ඉහළ ගොස් බද්දේගම සහ අවට ප්‍රදේශවල වංගතුර බැස යාමට තවදුරටත් බාධා එල්ල වීමට ඉඩ තිබූ බවද නාවික හමුදාව වැඩිදුරටත් පැවැසීය.

වක්වැල්ල පාලම ගාල්ල සහ බද්දේගම ප්‍රධාන මාර්ග යාකරන දකුණු පළාතේ දිගම පාලම වශයෙන් හැඳින්වෙන අතර බද්දේගම ප්‍රදේශයේ සහ ඒ අවට ජල ගැල්මක් ඇතිවූ අවස්ථාවක ගාල්ල දෙසට කඩිනමින් ඇතුළුවීම සඳහා පහසුම හා ප්‍රධානතම පිවිසුම් මාර්ගය වන්නේ මෙම වක්වැල්ල පාලමයි.

ගංවතුර බැසයාමට බාධා එල්ල කරමින් වක්වැල්ල පාලම යට සිරවී තිබූ දැව කඳන් හා අපද්‍රව්‍ය නාවික හමුදාව විසින් ඉවත් කරන අයුරු ඡායාරූපයෙන් දැක්වේ.

**නාවික හමුදා මාධ්‍ය ඒකකයෙනි**